දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය )
எனது இல )
My No. ) **CF/EXG/13/2024**

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) **2024/07/15**
Date )

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-107/2024

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය PL – 02 – 2006 (ඒ) වැටුප් පරිමාණයට අදාල තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (දෙවන වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය PL – 02 – 2006 (ඒ) සඳහා වන වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර සමත් විය යුතු වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය 2024/09/01 වන දින සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

**02 සුදුසුකම්**

මෙම විභාගයට අයදුම්කල හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට PL – 02 – 2006 (ඒ) සඳහා වන තනතුරක (පින්තාරුකරු, ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු, ජනක යන්ත්‍ර ක්‍රියාකරු, බොයිලේරු ක්‍රියාකරු, සපත්තු සාදන්නා, විකලාංග කාර්මික සහයක (ගාත්‍රා සාදන්නා, ශල්‍ය උපකරණ සාදන්නා, ) සත්ව පරිපාලක, අඳුරු කාමර සහයක, කිට විද්‍යා ක්ෂේත්‍ර උපස්ථායක, ජලනල කාර්මික/ පොම්ප ක්‍රියාකරු, බංගලා භාරකරු, කරණවෑම්, වඩු කාර්මික, සම් වැඩකරු, වැද්දුම්කරු, පෑස්සුම්කරු, බෙලෙක් වැඩකරු, ක්‍රෝසෙටියර්, ලියවන පට්ටල්කරු, පෙදරේරු, කම්මල්කරු, අරක්කැමි, මැහුම් ක්‍රියාකරු / ක්‍රියාකාරිණී, චිත්‍ර ශිල්පී, සෞඛ්‍ය රසායනාගාර සහයක, උපස්ථායක/ උපස්ථායිකා, දුරකථන ක්‍රියාකරු,) III ශ්‍රේණියේ පත්වීමක් ලබා සිටින / III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති හෝ මේ වන විට විභාගය සම්පූර්ණ නොකරන ලද නිලධාරීන්ට පමණි.

(**2024/08/07** දින වන විට III ශ්‍රේණියට පත්කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.)

සැලකිය යුතුයි :- සෞඛ්‍ය ලේකම්ගේ 2015.12.23 දිනැති හා පොදු චක්‍රලේඛ ලිපි අංක 02-90/2015 (I) හා බැදෙ

විකලාංග කාර්මික සහයක
සම් වැඩකරු
මැහුම් ක්‍රියාකරු/ක්‍රියාකාරිණී
කරණවෑම්
පින්තාරුකරු
කම්මල්කරු
වැද්දුම්කරු

2012.08.14 දිනට අදාල තනතුරේ අවම වශයෙන් වසර 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර ඇති නිලධරයන් එම තනතුරට අදාළ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (I වන කාර්යක්ෂමතා පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ.

(2009.08.14 දිනට පසු අදාළ තනතුරට පත්වීම් ලබා III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන් මේ සඳහා සුදුසුකම් ලබයි.)

සත්ව පරිපාලක
සපත්තු සාදන්නා
කිට විද්‍යා ක්ෂේත්‍ර උපස්ථායක
බෙලෙක් වැඩකරු
වඩු කාර්මික
ජලනල කාර්මික
පෙදරේරු
අඳුරු කාමර සහයක
ක්‍රෝසෙටියර්

2006.01.01 දිනෙන් පසු අදාළ තනතුරට පත්වීම් ලබා 2012.08.14 දිනට එම තනතුරේ අවම වශයෙන් වසර 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධරයන් එම තනතුරට අදාළ III ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ.

රසායනාගාර සේවක
ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු
උපස්ථායක/ උපස්ථායිකා
දුරකථන ක්‍රියාකරු
බංගලා භාරකරු,
අරක්කැමි
චිත්‍ර ශිල්පී,
ලියවන පට්ටල්කරු

පැරණි බඳවා ගැනීමේ පරිපාටියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධරයන්ට නව බඳවා ගැනීම් පරිපාටියේ III වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

පැස්සුම්කරු

පැරණි බඳවා ගැනීමේ පරිපාටියට අදාළ " ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි" විෂය සමත් නිලධරයන් නව බඳවා ගැනීම් පරිපාටිය පරිදි පවත්වන III වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් (I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්) නිදහස් කරනු ලැබේ.

03. අයදුම්පත්

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය", සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2024/08/07** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"PL – 02 – 2006(ඒ) වැටුප් පරිමාණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (දෙවන වාරය)"** ලෙස සඳහන් කල යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින්ද, සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද **රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"X4"ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු.:- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 08 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු

I. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කරගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත්ව නිකුත් කරනු ලබන හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පරිපාටිය

| | | |
|---|---|---|
| **විභාගයේ ස්වභාවය** | : | ලිඛිත පරීක්ෂණයකි. (බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ) |
| **කාලය** | : | පැය 02 |
| **මුළු ලකුණු** | : | 100 |
| **සමත් ලකුණු** | : | 40 |

07. විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
| --- | --- |
| රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ පහත කරුණු<br>❖ පත් කිරීම, පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම, කාර්යක්ෂමතා කඩඉම හා වෘත්තිය සමිති කටයුතු<br>ආයතන සංග්‍රහයේ පහත කරුණු<br>❖ සේවයට බඳවා ගැනීම, මාරු කිරීම, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආරක්ෂක ඇඳුම් හා නිළ ඇඳුම්, සුභ සාධක පහසුකම්, වෘත්තිය සමිති සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහයන්.<br>(බහුවරණ ප්‍රශ්න පත්‍රයකි) |

08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ /ආයතනයේ නියුතු සියළුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට (PL – 02 – 2006 (ඒ) වැටුප් පරිමාණය නියමකර ඇති III ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැන ගැනීමට සලස්වන්න. ( මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

සැ.යු **මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන ) II
ලේකම් වෙනුවට

**EXG**

| කාර්යාලීය ප්‍රායෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණිය PL – 02 – 2006 (ඒ) වැටුප් පරිමාණයට අදාල තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (දෙවන වාරය)

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..................................................................

..................................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමඟ නම ( සිංහලෙන් ) : ..................................................................

..................................................................................................................

(iv) මුලකුරු සමඟ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)

i. තනතුර ..................................................................

ii. III වන ශ්‍රේණියට පත් වූ දිනය ..................................................................

iii. දැනට ලබන වාර්ෂික වැටුප ..................................................................

iv. 2012/08/14 දිනට සේවා කාලය ..................................................................

v. ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

vi. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

vii. විද්‍යුත් ලිපිනය ..................................................................

02 (අ) දැන් සේවය කරන ආයතනය (සිංහලෙන්)..................................................................

(ඉංග්‍රීසියෙන්) ..................................................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ..................................................................

(ඇ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට - ☐

- පළාත් සභාවට - ☐

(ඇ) පළාත් සභාව යටතේනම් එය අයත් පළාත ..................................................................

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..................................................................

(ඉ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..................................................................

..................................................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..................................................................

..................................................................................................................

03 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..................................................................

04 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද?..................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද?..................................................................

| මුද්දර කොටුව |
|---|

05 **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින්* රු.......................ක් වටිනා මුද්දර අලවා ඇති බවත් * මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය.....................

..........................
අයදුම්කරුගේ අත්සන

06 **පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියාගේ /නිලධාරිණියගේ* සහතිකය**

**තම අයදුම්පත් බාරගන්න අවසාන දිනයට පෙර/ පසු මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්,** III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය.....................

..........................
නම සහ අත්සන

07 **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

................................................................................................මහතා/මිය/මෙනවිය*.........................................

නිලධාරියකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන* බවට රු .............. / ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීම අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පුද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කල බවද සහතික කරමි.

දිනය .....................

..................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

08 **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

.......................................................මහතා / මහත්මිය / මෙනවිය*, ..................................... නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .....................

..................................
**විමධ්‍යගත කොට්ඨාශ**
**විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ**
**අත්සන**
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(*අනවශ්‍ය කොටස් කපා හරින්න )